# ප්‍රාදේශීය වශයෙන් ආර්ථික සංවර්ධනය සිදුවීමෙහිලා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මගින් සිදුවන බලපෑම.

ඩබ්. ඩී. එල්. වෙලගෙදර[1]

**සංක්ෂේපය**

ඕනෑම ආර්ථිකයක වර්ධනය මෙන්ම සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඒ සමඟ බැඳී පවතින ආර්ථිකමය වැදගත්කමක් පවතින සංකල්පයක් ලෙසට සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සංකල්පය හඳුන්වාදිය හැකිය. ගෝලීයකරණය හා ප්‍රාදේශීයකරණය තුළ මුහුණ දීමට සිදුව ඇති සමාජ හා ආර්ථික අභියෝගයන් ජයගැනීම සඳහා ඇති සාධ්‍යතාවයකින් යුතු උපායශීලි ක්‍රියා මාර්ගයක් වශයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් ස්ථාපනය සිදුකිරීම අවශ්‍ය වේ. මේ අනුව මහනුවර දිස්ත්‍රික්කයට අයත් වන වැදගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙසට හාරිස්පත්තුව ප්‍රාදේශීය කොට්ඨාසයට අයත් වන ග්‍රාම නිලධාරි වසම් 5 ක් තෝරා ගනිමින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත නියැදිය තෝරා ගැනින. සසම්භාවීව තෝරා ගන්නා සියලුම ඒකක නියැදියට ඇතුළත් කර ගනිමින් පොකුරු නියැදීම යටතේ එක්පිය පොකුරු නියැඳුම් ක්‍රමය යොදා ගනු ලැබීය. දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතික දත්ත යොදා ගන්නා අතර ප්‍රාථමික දත්ත යටතේ ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගැනීම හා ද්විතික දත්ත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් ප්‍රකාශිත වාර්තා, ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා යනාදි පුර්වයෙන් ප්‍රකාශිත දත්ත යොදාගනු ලැබීය. ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය මගින් දත්ත ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමයක් යොදා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදි ලබා ගන්නා ප්‍රමාණාත්මක දත්තයන් විස්තරාත්මක සංඛ්‍යානය යටතේ මෙන්ම බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් මත පදනම් වෙමින් විශ්ලේෂණය සිදු කරන ලදී. ප්‍රස්ථාර, වගු සටහන් හා SPSS මෘදුකාංගය යොදාගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණ. බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් මත පදනම් වීමේ දී තෝරාගත් එම ප්‍රදේශවල සැබෑ වශයෙන්ම ආර්ථික සංවර්ධනයක් සිදු වී ඇත්දැයි යන්න කල්පිත ගොඩනගා ගනු ලැබීය. මේ අනුව සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්න සඳහා ඇති බාධක හා ගැටලු හදුනා ගැනීමත් සංවර්ධනය සඳහා රජය ගෙන ඇති විසඳුම් ප්‍රමාණවත්ද යන බව හා ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා සුළු හා පරිමාණ කර්මාන්ත අංශය තුළ නව යෝජනා හා නිගමන ඉදිරිපත් කිරීම සිදු කෙරිණ.

**මුඛ්‍ය පද :** කර්මාන්ත, සුළු හා පරිමාණ කර්මාන්ත, ව්‍යවසායකත්ව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, danushalakmali1027@gmail.com